ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

පදනම් විභාගය - ජූලි 2011

## (50) මූලික ගිණුම්කරණය
(Basic Accounting)

---

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ට නිරීක්ෂණය වූ අඩුපාඩු හා දුර්වලතා පහත සාරාංශ කොට දක්වා ඇත.

### A - කොටස

**ප්‍රශ්න අංක 01 - ලකුණු 30**

1. අනිවාර්ය අංක 01 ප්‍රශ්නය මෙම කොටසට ඇතුලත්ය. සරල ගිණුම් සිද්ධාන්ත පිළිබඳ දැනුම පිරික්සන බහුවර්ණ ප්‍රශ්න 15 ක් ඇතුලත්ය. ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 30 ක් හිමිය. සෑම ප්‍රශ්නයකටම විකල්ප පිළිතුරු 04 ක් දී ඇති අතර එයින් නිවැරදි පිළිතුර තෝරා එම අංකය එම ප්‍රශ්නයට අදාල ඉංග්‍රීසි අක්ෂරය සමග පිළිතුරු පත්‍රිකාවේ සටහන් කිරීම අයදුම් කරුවන්ගෙන් අපේක්ෂිතය.

2. දී ඇති උපදෙස් පරිදි නිවැරදි පිළිතුරේ අංකය තෝරා අදාල ඉංග්‍රීසි අක්ෂරය සමග පිළිවෙලින් බොහෝ දෙනා පිළිතුරු පොතේ ලියා තිබුනද දී ඇති උපදෙස් වලට පටහැනිව යමින් ප්‍රශ්න පත්‍රයේම පිළිතුර සළකුණු කර ප්‍රශ්න පත්‍රය පිළිතුරු පතට යා කල අයදුම්කරුවන් විය. එසේම පිළිතුරේ අංකය ලිවීම වෙනුවට තෝරා ගත් පිළිතුර ලියූ අවස්ථා විය. මෙසේ කිරීමෙන් අයදුම්කරුවන් සිය කාලය නාස්ති කර ඇත.

3. අනිවාර්ය ප්‍රශ්නයක් වීම නිසා සෑම දෙනාම පාහේ පිළිතුරු සපයා තිබිණ.

4. එකිනෙක ප්‍රශ්නය සම්බන්ධ දක්වා ඇති කුශලතාවය පහත සඳහන් පරිදිය.

   A - මූල්‍ය ප්‍රකාශ වල පරමාර්ථය පිළිබඳ අවබෝධය අඩු කමින් බොහෝ දෙනා නිවැරදි පිළිතුර තෝරා ගැනීමට අපොහොසත් වී තිබිණ.

   B - බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුර තෝරා ගැනීමට පොහොසත් වී තිබිණ.

   C - බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුර තෝරාගෙන තිබිණ.

   D - ගිණුම් සංකල්ප පිළිබඳ අවබෝධය අඩු කමින් බොහෝ දෙනා වැරදි පිළිතුරු තෝරා ගෙන තිබිණ.

   E - ප්‍රභව ලේඛන පිළිබඳ දැනුම අඩුකමින් බොහෝ පිරිසක් වැරදි පිළිතුරු සපයා තිබුණි.

   F - මෙය ගණනය කිරීමෙන් නිවැරදි පිළිතුර තෝරා ගත යුතු සරල ප්‍රශ්නයකි. ගණනය කල යුතු ආකාරය පිළිබඳ නොදැනුවත් කම නිසා හෝ සදොස්ව ගණනය කිරීම නිසා නිවැරදි පිළිතුර බොහෝ දෙනා වෙතින් ගිලිහී තිබිණ.

   G – ගිණුම්කරන සමීකරණය ගනුදෙනුවලට බලපාන ආකාරය පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොමැතිකමින් බොහෝ පිරිසක් වැරදි පිළිතුරු සපයා තිබුණි.

H – අගරු වෙක්පත් ගිණුම් ගතකල යුතු ආකාරය පිළිබඳ බොහෝ පිරිසකගේ දැනුම අඩු බව දී ඇති පිළිතුරු වලින් පෙනී යයි.

I – විචල්‍ය පිරිවැයේ හැසිරීම නිවැරදිව හඳුනාගෙන ඇත්තේ සුළු පිරිසකි.

J – මෙයද සරල ගණනය කිරීමක් මගින් නිවැරදි පිළිතුර තෝරා ගත යුතු ප්‍රශ්නයකි.ගණනය කිරීම පිළිබඳ නිවැරදි අවබෝධයක් නොවීම නිසා නිවැරදි පිළිතුර තෝරා ගැනීමට බොහෝ දෙනා අසමත් වී ඇත.

K – පිරිවැය ඒකක හා පිරිවැය මධ්‍යස්ථාන පිළිබඳ නිවැරදි අවබෝධයක් නොවීමෙන් මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා ගැනීමට බොහෝ දෙනා අසමත් වී ඇත.

L – EPF, ETF සුබ සාධන වියදම් ශ්‍රම පිරිවැටුමට අදාල නොවන බව වටහා ගත්තේ නම් මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර පහසුවෙන් තෝරා ගත හැකිය. ඒ පිළිබඳ අවබෝධය අඩු කම නිසා සමහරුන් වැරදි පිළිතුරු තෝරා ගෙන තිබිණ.

M – බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුනත් ඇතැමුන් සදොස් පිළිතුරු ද සපයා තිබිණ.

N – ප්‍රාථමික පිරිවැයට පරිභෝජනය කල අමුද්‍රව්‍ය හා සෘජු ශ්‍රමය ඇතුලත් බව නොදැන ගණනය කිරීම නිසා බොහෝ දෙනා වැරදි පිළිතුර තෝරා ගෙන තිබිණ.

O – මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුර තෝරාගෙන තිබිණ. එහෙත් නිෂ්පාදන අධීක්ෂක ගේ වැටුප වක්‍ර පිරිවැය ලෙස හඳුනා නොගැනීම නිසා වැරදි පිළිතුර තෝරා ගත් අයවලුන්ද වූහ.

## B - කොටස

### ප්‍රශ්න අංක **02** - ලකුණු 25

තින්ත ආලේප කිරීමේ වැඩපලකට අදාලව දී ඇති තොරතුරු ආශ්‍රයෙන් වෙළෙඳ හා ලාභා'ලාභ ගිණුම සහ ශේෂ පත්‍රය පිළියෙල කිරීම පිළිබඳව දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම අනිවාර්ය වූ ප්‍රශ්නය ඉදිරිපත් කර ඇත. අයදුම්කරුවන්ගෙන් අඩකට වැඩි පිරිසක් ලබා ඇත්තේ අඩු ලකුණු ප්‍රමාණයකි. මෙසේ ලකුණු අඩුවීමට බලපෑ කරුණු කිහිපයක් පහත දැක්වේ:

<u>වෙළෙඳ හා ලාභා'ලාභ ගිණුම පිළියෙල කිරීමේදී දක්නට ලැබුණු අඩුපාඩු</u>:

(1) අයදුම්කරුවන් බහුතරයකට සේවා ආදායම සහ විකුණුම් පිරිවැය නිවැරදිව ගලපා ගැනීමට නොහැකිවී ඇත. සේවා ආදායම වශයෙන් බොහෝ පිරිසක් පෙන්නුම් කර තිබුණේ රු.990,000/- ආදායම පමණි. සේවා ආදායමට බලපාන ගැලපිලි කෙරෙහි අවධානය යොමු කර නොමැති බව දක්නට ලැබුණි.

(2) විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී බොහෝ පිරිසකගේ සැලකිල්ල යොමු වී තිබුණේ ගිණුම්වල වටිනාකම වූ රු.680,000/- කෙරෙහි පමණි. අළුත්වැඩියා සඳහා වූ රු.140,000/-, තින්ත සැපයුම්කරුවන්ට ගෙවිය යුතු රු.64,000/- ක් සහ ඉතිරි ද්‍රව්‍යවල පිරිවැය වූ රු.24,000/- කෙරෙහි සැලකිල්ල දක්වා නොතිබුණි.

(3) වියදම් බොහෝ දුරට නිවැරදිව ඇතුලත් කර තිබුණද සමහරු ගැනිලිද වියදම් ලෙස පෙන්නුම් කර තිබුණි. ගිණුම් තබන කාලපරිච්ඡේදය මාස 3 ක් වුවද සමහරු වර්ෂයකට අදාල වූ අදාල වූ ගෙවල් කුලී රු.96,000/- ටම ලාභා'ලාභ ගිණුමෙහි පෙන්නුම් කර තිබුණි. ඉදිරියට ගෙවූ ගෙවල් කුලී සටහන් කර නොතිබුණි. ක්ෂය ගණනය කිරීම් නිවැරදිව කර තිබුණේ ඉතාමත් සුළු පිරිසකි. සමහරු වර්ෂයකට අදාල ක්ෂය පෙන්නුම් කර ලාභා'ලාභ ගිණුමෙහි ඇතුලත් කර තිබුණි.

(4) වෑන් රථය විකිණීමට අදාල වූ රු.405,000/- බොහෝ පිරිසක් වැරදි සහගතව ආදායමක් ලෙස සලකා ලාභා'ලාභ ගිණුමෙහි සටහන් කර තිබුණි.

ශේෂ පත්‍රය පිළියෙළ කිරීමේදී දක්නට ලැබුණු අඩුපාඩු:

(1) වැන් රථය විකිණීමට අදාල රු.405,000/- ප්‍රාග්ධනයේ කොටසක් ලෙස බෙහෝ පිරිසක් ගලපා නොතිබුණි. එමෙන්ම සමහරු ප්‍රාග්ධනය ලෙස සළකා තිබුණේ ආරම්භයේ යෙදවූ රු.25,000/- පමණි. තවත් සමහරු වැල්ඩින් පිරියත වූ රු.120,000/- පමණක් ප්‍රාග්ධනය ලෙස සළකා තිබුණි.

(2) ගැනිලි නිවැරදිව ගලපා තිබුණේ සුළු පිරිසකි. සමහරු මුදල් ආපසු ගැනීම් රු.80,000/- පමණක් ගැනිලි ලෙස සළකා තිබුණි. තවත් සමහරු හිමිකරු මිලදී ගත් ලොතරැයි වටිනාකම වූ රු.8,000/- පමණක් ගැනිලි ලෙස සළකා තිබුණි. නිවැරදිව ගැනිලි සටහන් කර තිබුණේ ඉතාමත් සුළු පිරිසකි.

(3) කුමාරි හාඩ්වෙයාර් ස්ටෝර්ස් වෙතින් ලබාගත් ණය මුදල රු.300,000/- සමහරු ශේෂ පත්‍රයේ සටහන් කර තිබුණේ ආපසු ගෙවූ රු.30,000/- සැලකිල්ලට නොගෙනය.

(4) දී ඇති ගනුදෙනු ආශ්‍රයෙන් බැංකු ගිණුම තුලින් බැංකු අයිරාව සොයා ගත යුතු වුවද බෙහෝ පිරිසක් එය නිවැරදිව ගලපා නොතිබුණි.

(5) වත්කම් වල ක්ෂය සහ එය අඩුකල වටිනාකම ශේෂ පත්‍රය තුල පෙන්නුම් කල යුතු වුවද ක්ෂය හරිහැටි ගණනය නොකිරීම නිසා නිවැරදිව සටහන් කිරීමට බොහෝ පිරිසක් අපොහොසත් වී ඇත.

## ප්‍රශ්න අංක **03** - ලකුණු 25

A. බැංකුව සමග සිදුකරනු ලබන ගනුදෙනු ගිණුම්වල සටහන් කිරීම සහ බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම පිළිබඳ ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා පිළියෙල කර තිබූ මෙම ප්‍රශ්නයට බොහෝ අපේක්ෂකයන් නිවැරදිව පිළිතුරු සැපයීමට අපොහොසත්ව තිබුණි. බොහෝ දෙනෙකුට මුදල් පොතට යා යුතු තොරතුරු හා බැංකු සැසඳුම් ප්‍රකාශයට යා යුතු තොරතුරු මොනවාද යන්න නිසි අවබෝධයක් නොතිබුණු අතර ඇතැම් අය SB හා DNB ගිණුම් පටලවා ගෙන ගනු දෙනු සටහන් කර තිබූ බව නිරීක්ෂණය විය. මේ නිසා SB හා DNB බැංකුවලට අදාලව ශේෂ පත්‍රයේ පෙන්විය යුතු නිවැරදි ශේෂය නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් වී තිබුණි. තවද, අපේක්ෂකයන්ගෙන් ඉල්ලා තිබුණේ SB ගිණුමේ බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන ලෙස වුවද ඇතැම් අය මෙම ගිණුම් දෙකෙහිම බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමට ගොස් අනවශ්‍ය කාලයක් වැය කර තිබුණි.

B. ශේෂ පත්‍රය තුලනය නොවූ අවස්ථාවක වෙනස අවිනිශ්චිත ගිණුමක සටහන් කර අවසන් ගිණුම් පිළියෙල කිරීමෙන් පසු සොයා ගන්නා වැරදි නිවැරදි කර අවිනිශ්චිත ගිණුම පියවීම සම්බන්ධ කරනු ඇතුලත් කර සකස් කරන ලද මෙම ප්‍රශ්නයට ද සාර්ථක පිළිතුරු සැපයීමට බොහෝ අපේක්ෂකයන් අසමත් වී තිබුණි. මෙවැනි ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමටද ද්විත්ව සටහන් ක්‍රමය පිළිබඳ හොඳ අවබෝධයක් තිබිය යුතු වුවත් බොහෝ අපේක්ෂකයන්ට එම දැනුම අල්ප වීම මෙම අසාර්ථකත්වයට හේතු වී තිබුණි. මෙහිදී අවිනිශ්චිත ගිණුමට බලනොපාන කරුණු මොනවාද යන්න සහ ලාභය සංශෝධනය කිරීමට අදාල කරුණු මොනවාද යන්න අපේක්ෂකයන්ට නිසි අවබෝධයක් නොමැති බව ලියා ඇති පිළිතුරු අනුව නිරීක්ෂණය විය. තවද, අවිනිශ්චිත ගිණුමට බලනොපාන වැරදි නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ජර්නල් සටහන් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තිබුණද අවිනිශ්චිත ගිණුම පියවීමට අවශ්‍ය ජර්නල් සටහන්ද පෙන්වා තිබුණි.

## C - කොටස

**ප්‍රශ්න අංක 04 - ලකුණු 10**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

A. මෙහි (a) කොටසේ දී ඇති ගනුදෙනු වලට අදාල ප්‍රාථමික සටහන් පොත සඳහන් කරන ලෙස ඉල්ලා තිබූ අතර බොහෝ දෙනෙකු මේ සඳහා සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. එහෙත් ස්ථාවර වත්කම් මිලදී ගැනීමට අදාල ප්‍රාථමික පොත සඳහන් කිරීමට බොහෝ අපේක්ෂනයන් අපොහොසත් වී තිබුණි. මෙහි (b) කොටසට අදාල ගැනුම් ජර්නලය බොහෝ දෙනෙකු පිළියෙල කර තිබුණද එහි එන වෙළෙඳ වට්ටම් ගණනය කර දැක්වීම නිවැරදිව සිදු කර නොතිබුණි. තවද, ඇතැම් අය ස්ථාවර වත්කම් මිලදී ගැනීම්ද ගැනුම් ජර්නලයේ සටහන් කර තිබුණි.

B. පිරිවැය වර්ගීකරණය පිළිබඳව දැනුම මැනීම සඳහා සකස් කර තිබූ මෙම ප්‍රශ්නයටද බොහෝ අපේක්ෂකයන් සාර්ථකව පිළිතුරු දී තිබුණද ඇතැම් අපේක්ෂකයන්ට වානේ කැපීමේ යන්ත්‍ර ක්ෂය, වෑල්ඩින් කරන්නන්ගේ වේතන හා නිෂ්පාදන පුරස්කාර ගෙවීම සම්බන්ධ පිරිවැය වර්ග හඳුනාගත නොහැකිව තිබුණි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 10**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

A සහ B වශයෙන් කොටස් දෙකකින් සමන්විත තෝරාගෙන පිළිතුරු සැපයිය හැකි ප්‍රශ්නයකි. ක්ෂය ගණනය කිරීම සහ උපකරණ බැහැර කිරීමේ ගිණුම පිළියෙල කිරීම පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීම සඳහා මෙම ගැටළුව ඉදිරිපත් කර ඇත. වැඩි පිරිසක් ලබා තිබුණේ අඩු ලකුණු ප්‍රමාණයකි. පොදුවේ දක්නට ලැබුනු දුර්වලතා පහත දැක්වේ:

(1) එකිනෙක වත්කමට අදාලව නිවැරදිව ක්ෂය ගණනය කිරීමට බොහෝ පිරිසක් අසමත්ව ඇත.
(2) දී ඇති උපදෙස් හරිහැටි අවබෝධ කර නොගෙන ක්ෂය ගණනය කිරීමට යාමෙන් අඩු ලකුණු ලබා ඇත.
(3) උපකරණ බැහැර කිරීමේ ගිණුම තුල ඉවත් කල උපකරණ වල ක්ෂය නිවැරදිව සටහන් නොකිරීම නිසා අඩු ලකුණු ලබා ඇත.
(4) තවත් සමහරු ඉවත් කිරීමේ ගිණුමේ සටහන් පැති මාරු කර ලියා තිබෙනු දක්නට ලැබුණි.
(5) B කොටසට පිළිතුරු සැපයීමේදී අතිකාල දීමනා නිවැරදිව ගණනය නොකර සතියකදී ඉපැයූ මුළු වේතනය සෙවීම නිසා අඩු ලකුණු ලබා ඇත.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 10**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

A. මිල කිරීම සඳහා බර තැබූ සාමාන්‍ය ක්‍රමය අනුගමනය කරමින් තොග ලැබීම් හා නිකුත් කිරීම් සටහන් කරන තොග ලෙජරයක් පිළියෙල කිරීම මෙම කොටසින් බලාපොරොත්තු වූ අතර පිළිතුරු සැපයූ අයගෙන් අඩක් පමණ සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. එහෙත් ඇතැම් අය ගබඩා ලෙජරය යනු කුමක්ද යන්න නිසි අවබෝධයක් නොතිබුණු අතර ඔවුන් ඒ සඳහා ලෙජර් ගිණුම් පිළියෙල කර තිබුණි. ගබඩා ලෙජරයේ සැකැස්ම පිළිබඳ අවබෝධයක් තිබූ ඇතැම් අයට බර තැබූ සාමාන්‍ය ක්‍රමය යටතේ මිල කිරීම පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති බව නිරීක්ෂණය විය.

B. මෙම කොටසටද පිරිවැයකරණය පිළිබඳ දැනුම මැනීම සඳහා පිළියෙල කර තිබුණද මෙම ප්‍රශ්නයට අංක ගණිතමය දැනුම යොදාගෙන පහසුවෙන් පිළිතුරු සපයිය හැකිව තිබුණි. එසේ පිළිතුරු සපයා සම්පූර්ණ ලකුණු ලබාගත් අපේක්ෂකයන් ද දක්නට ලැබුණි. බොහෝ අපේක්ෂකයන් මෙහි මුළු පිරිවැය ගණනය කරන තෙක් නිවැරදිව සිදුකර තිබුණද එක් මගියෙකුට එක් කිලෝමීටරයක් සඳහා වූ පිරිවැය නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් වී තිබුණි.

- * * * -